පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2019
## නර්තනය

පාසලේ නම : ……………………………………………………
ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුලත්වීමේ අංකය : ……………………………………
……………………………………

කාලය : පැය 2 යි.

## I - කොටස

- 1 සිට 25 තෙක් සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 26 සිට 50 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු හිස්තැන මත ලියන්න'

01. " සිංහල තිත් තාල ක්‍රමය " ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
   i.වින්ස්ටන් සෝමපාල
   ii. සරත් විජේවර්ධන
   iii. ඩබ්ලිව්. ඩී මකුලොලුව
   iv. ජේ.ඊ සේදරමන්
   v. මුදියන්සේ දිසානායක

02. "සියොපත් පතිනේ - දිගු නුවණතිණේ..." මෙම කවිය
   i. කොහොඹා හැල්ලේදී ගායනා කරයි.
   ii. මඩුපුරයේදී ගායනා කරයි.
   iii. රට යකුමේදී ගායනා කරයි
   iv. ග්‍රහ පන්ති වලදී ගායනා කරයි
   v. කිරිමඩුවේ දී ගායනා කරයි

03. ගවසම්පත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පවත්වන සබරගමු සම්ප්‍රදායේ කිරි මඩු ශාන්තිකර්මයේදී පුද ලබන්නේ,
   i. මංගර දෙවියන් හා පත්තිනි දෙවියන්
   ii. පත්තිනි හා බණ්ඩාර දෙවියන්
   iii. මංගර දෙවියන් හා දෙවොල් දෙවියන්
   iv. දෙවොල් දෙවියන් හා පත්තිනි දෙවියන්
   v. කතරගම දෙවියන් හා දෙවොල් දෙවියන්

04. සබරගමු නර්තන සමුප්‍රදායේ සහ පහතරට නර්තන සම්ප්‍රදායේ දරුඵල අපේක්ෂාවෙන් කරණු ලබන ශාන්ති කර්මය ලෙස
   i. රට යකුම හා කඩවර කංකාරිය
   ii. කුමාර සමයම හා රටයකුම
   iii. කුමාර සමයම සහ වලියක් මංගල්‍යය
   iv. කුමාර සමයම හා කඩවර කංකාරිය
   v. දහ අට සන්නිය සහ රටයකුම

05. බලි ශාන්ති කර්මයේදී බලි ඇදුරා විසින් අතට ගනු ලබන රංගභාණ්ඩය වන්නේ,
   i. අත්මිණිය, පොල්පන්දම
   ii. තාලම්පට, අත්මිණිය
   iii. ඊගස, අත් පන්දම
   iv. දුණු පන්දම, ගගණය
   v. ගගණය, පන්දම

Education NCP - www.edncp.lk

06. සම්දෙකක් සුලු දුනි - ලණුපට නාථ දෙවියනි
සමරම ඉසුරු දෙවිදුනි - හඬෙහි ඉරමය විශ්ණු දෙවිදුනි
මෙම කවි යෙන් කිනම් වාද්‍ය භාණ්ඩයක් පිළිබඳ කියැවේද?

i. ගැටබෙරය
ii. පොකුරු බෙරය
iii. රබාන
iv. උඩැක්කිය
v. ඝෝෂක බෙරය

07. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රභවයට දායක වූ ප්‍රමුඛ ශිල්පියා

i. භරතමුණි
ii. නවාබ් වජිද් අල්ෂා
iii. ශාන්ත දේව ඝෝෂ්
iv. නන්දිකේෂ්වර
v. රවීන්ද්‍රනාත් තාගෝර්

08. උගෙ කාරිය ඌ පැළපොල් වනසනවා
මගෙ කාරිය මම පැළපොල් සිටුවනවා.........
යන කවිය අයත් ශාන්ති කර්මය .... හා නාටයම අවස්ථාව ..... වේ.

i. පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා නානුමුරය වේ.
ii. පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා කපුයක්කාරිය වේ.
iii. උඩරට නර්තන සම්ප්‍රදායේ කොහොඹා කංකාරිය හා ගුරුගේ මාලාව වේ
iv. උඩරට නර්තන සම්ප්‍රදායේ කොහොඹා කංකාරිය හා ඌරා යක්කම
v. සබරගමු නර්තන සම්ප්‍රදායේ පහන්මඩු හා අසුර යක්කම

09.

ඉදිරිපස රූපයෙන් දක්වෙන්නේ,



i. මල් යහනාව
ii. සන්නි කුඩුව
iii. යහන
iv. අයිලය
v. කිරිමැස්ස

10. රත් පැහැයෙන් යුත් වානරයෙකුගේ මුහුණට සමාන වෙස් මුහුණක් පළඳිනු ලබන්නේ,

i. අභිමාන යකා
ii. මහසෝනා
iii. ඊරි යකා
iv. සූනියම් යක්ෂණිය
v. තොට යකා

11. විජය රජු කුවේණිය සමඟ සයනයේ සැතපී හිඳින විට රාත්‍රී භාගයේ තූර්ය නාදයන් ඇසුනේ

i. සිරිනිවාස පුරයේදීය
ii. පුලතිසි පුරයේදිය
iii. නාගපට්ටනම් හිදීය
iv. සිරි වස්තුණ පුරයේදීය
v. සිරසවස්තු පුරයේදීය

12. " අත්තන මලසේ ඇදි සුදු සේලය ඉණවට රැළි අල්ලා" මෙහි

i. සදිස්මත් 24 ගිමත් 30
ii. සැදිස්මත් 26 ගිමත් 32
iii. සදිස්මත් 30 ගිමත් 24
iv. සදිස්මත් 32 ගිමත් 26
v. සදිස්මත් 25 ගිමත් 33

Education NCP - www.edncp.lk

13. "ජිං ජිමිත තත් තකට / දොංජිංත ගත දොමිත / ගුං දෙගත ගත්ත ගුං"...... මෙය
   i. මාත්‍රා 2 + 3 දෙතිතට ය.
   ii. මාත්‍රා 3 + 3 තනිතිතටය
   iii. මාත්‍රා 3 + 4 දෙතිතටය
   iv . මාත්‍රා 2 + 2 + 3 තුන්තිතටය
   v. මාත්‍රා 2 + 4 දෙතිතටය

14. රස හා භාව පිළිබඳ අදහස් දැක්වූ අපරදිග හා පෙරදිග මතවාදීන් වන්නේ...........
   i. භරතමුණි, නන්දිකේශ්වර හා ඇරිස්ටෝටල් ප්ලේටො
   ii. සොක්‍රටීස්, ප්ලේටෝ, හා නන්දිකේශ්වර , ආනන්ද වර්ධන
   iii. නන්දිකේශ්වර, සොක්‍රටීස් හා අභිනව ගුප්ත , උද්ගම ධනංජය
   iv. අභිනව ගුප්ත, භරතමුණි, නන්දිකේශ්වර , ප්ලේටෝ
   v. ඇරිස්ටෝටල්, භරතමුණි, නන්දිකේශ්වර , ප්ලේටෝ

15. පටාචාරා කලා කෘතිය නෙළුම් පොකුණ රඟහලේදී වේදිකා ගත කරන ලද්දේ කිනම් වර්ෂයේදී ද?
   i. 2013
   ii. 2014
   iii. 1998
   iv. 1996
   v. 2016

16. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ ප්‍රථම මුද්‍රා නාට්‍ය
   i. ශිව රංග
   ii. සැළලිණිය
   iii. සීතාභරණ
   iv. රන්දද
   v. චණ්ඩාලිකා

17. ඉන්දියාවේ මහා රාෂ්ටය හා ඉම්පාල් යන නගර කේන්ද්‍ර කොට ගෙන බිහි වූ නර්තන සම්ප්‍රදායන් වන්නේ,
   i. කථකලි හා මනිපුරි
   ii. කතක් හා භරත නාට්‍යම්
   iii. මනිපුරි හා කතක්
   iv. කථක් හා මනිපුරි
   v. භරත හා කතකලි

18. රාමාට්ටම් නිර්මාණය කරන ලද්දේ
   i. ජැමොරින් රජු විසින්
   ii. තාම්පුරම් රජු විසිනි
   iii. චක්කියාර් බ්‍රහ්මණයින් විසිනි
   iv. ක්‍රිෂ්ණ අයියර් විසිනි
   v. බිර්ජු මහරාජ විසිනි

19. රූපවාහිත කලා කෘති රස විඳීමේදී ඉන් උසස් රසවින්දනයක් ලබා ගැනීමට
   i. එහි පසුබිම පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය
   ii. නර්තන ශිල්පින්ගේ ශරීරයේ හැඩය පිළිබඳ අවබෝධය තිබිය යුතුය.
   iii. විකාශනය වන නාලිකාව පිළිබඳ අවබෝධය තිබිය යුතුය.
   iv. නර්තන නිර්මාණය කළ ශිල්පියා පිළිබඳ අවබෝධය තිබිය යුතුය.
   v. එම රංගනයේ චලන සංඛ්‍යාව පිළිබඳ අවබෝධය තිබිය යුතුය.

Education NCP - www.edncp.lk

20 . බෙර වාදනයේදී ඊට ආවේණික ධ්වනි ගුණය සඳහා  බලපාන හේතුවක් නොවන්නේ,

i. තාට්ටුවට යොදා ඇති හමේ ඝණත්වය
ii. තූර්ය භාණ්ඩයේ හැඩය දිග පළල හා ඝණත්වය
iii. භාවිත කළ අමුද්‍රව්‍ය වල මිල
iv. යොදා ගත් අමුද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම
v.  හඬ උපදවන ආකාරය

21. " පතහ විස්ස " නමින් හැඳින්වෙන පිනුම් විශේෂය දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදාය වන්යේ,

i. උඩරට නර්තන සම්ප්‍රදාය
ii. පහතරට නර්තන සම්ප්‍රදාය
iii. සබරගමු නර්තන සම්ප්‍රදාය
iv. භරත නර්තන සම්ප්‍රදාය
v. කථකලි නර්තන සම්ප්‍රදාය

22. දේශීය නර්තන සම්ප්‍රදායේ මාත්‍රා 3 + 4 දෙතිතට සමාන භාරතීය නර්තන සම්ප්‍රදාය හා බැඳි තාල රූපය....... ලෙස හැඳින්වේ.

i. හින්දුස්ථායි තාල පද්ධතියේ ජබ්ලය
ii. හින්දුස්ථානි තාල පද්ධතියේ ධධාරා තාලය
iii. කර්ණාඨක තාල පද්ධතියේ රූපක තාල
iv. කර්ණාඨක තාල පද්ධතියේ තිශ්‍ර චාපු
v. කර්ණාඨක තාල පද්ධතියේ මිශ්‍ර චාපු

23. ද්‍රවිඩ ජනතාවගේ ගැමි නැටුමක් වන කරගම් නර්තනය පැවැත්වීමේ අරමුණක් නොවන්නේ,

i. දේව භක්තිය ප්‍රකාශ කිරීම
ii. දේව ආශිර්වාදය ලබා ගැනීම
iii. නියඟය වළක්වා වර්ෂාව ලබා ගැනීම
iv. දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකෙන රෝග වලින් වැළැකීමට
v.  හිරු දෙවියන් පිදීම

24. වන්නම් රචනා කිරීමේ අරමුණු සලකා බැලීමේදී පූජාර්ථමය ලක්ෂණයක් ඉස්මතු වන්නේ,

i. උඩරට වන්නම්
ii. උඩරට හා පහතරට වන්නම්
iii. පහතරට වන්නම්
iv. පහතරට හා සබරගමු වන්නම්
v. සබරගමු වන්නම්

25. මහනුවර දළදා මාලිගාවේ දළදා පෙරහැර මංගල්‍යය අවසානයේදී විෂ්ණු දේවාලය හා සම්බන්ධ පවත්වනු ලබන ශාන්තිකර්මය වනුයේ

i. උඩරට කොහොඹා කංකාරි ශාන්තිකර්මය
ii. උඩරට වලියක් මංගල්‍යය ශාන්තිකර්මය
iii. පහතරට වලියක් මංගල්‍යය ශාන්තිකර්මය
iv. සබරගමු වලියක් මංගල්‍යය ශාන්තිකර්මය
v. උඩරට කඩවර කංකාරි ශාන්තිකර්මය

- හිස්තැන් පුරවන්න

26. " ශුද්ධ මාත්‍රය " නර්තන අංගය අන්තර්ගත වන්නේ ........................................ ශාන්තිකර්මයේය.

27. අත්ලෙන් බෙර වම් ඇස සුළු ප්‍රහාරයකින් බුරුල් කර ගැනීම හා බෙර ගැටිය අතික් තද කරගැනීම ........................................... නම් වේ.

28. ඉඹුල් වෘක්ෂය තම වාසස්ථානය කොටගත් ග්‍රහයා වන්නේ ........................................ ය.

29. ........................................ දී ප්‍රශස්ති කාව්‍ය මුලින්ම ගායනා කොට ඇත.



Education NCP - www.edncp.lk

30. සබරගමු මුල් මාත්‍රය නටනුලබන තාල රූපය මාත්‍රා ....................................... ය.

31."රොමිතත් රොමිතකු දාං ................................................... රොමිතත් රොමිතකු දාං " මෙය මයුරා වන්නමේ සීරුමාරුවයි.

32. රාධා හා ක්‍රිෂ්ණාගේ ප්‍රේම වෘත්තාන්තය තේමා කර ගනිමින් නිර්මාණය කර ඇති නර්තන සම්ප්‍රදාය ......................................................... නම් වේ.

33. මිනිසා තුල ඇතිවන චෛතසික වෙනස හඳුන්වනුයේ ..................................... යනුවෙනි.

34. එකල සමාජයේ ප්‍රධාන ලක්ෂණයක් වූ කුලභේදය නිරූපණය වන නාට්‍යමය අවස්ථාවක් ලෙස ........................................................ නම් කල හැක.

35. ..................................... විසින් විභාව, අනුභාව හා ව්‍යභිචාරීභාව යන කරුණුවල සංයෝජනයෙන් රස නිශ්පත්තිය සිදුවන බව දක්වා ඇත.

36. තම්මැට්ටමේ මුහුණත් දෙක ..................................................... හා ..................................................... වේ.

37. උඩරට නැටුම් ශාස්ත්‍රය හා වන්නම් පිළිබඳ සඳහන් වන ..................................... ග්‍රන්ථය ඇසුරින් මල්වතු විහාර වාසි හිමිනමක් රචනා කළ ..................................... ග්‍රන්ථය වේ.

38. උඩරට නර්තන සම්ප්‍රදායේ 10 වන පා සරඹය ..................................... නමින් හැඳින්වෙන අතර, .....................................ගොඩසරඹ " පැනීමේ සරඹය " ලෙස හඳුන්වයි.

39. හටන් කවි තුලින් ..................................... රසය දැක්වෙන අතර ..................................... කරුණා රසය ජනිතකරයි.

40. "උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා " යන කවි පදය ..................................... ශාන්තිකර්මයේ එන .....................................නර්තන අංගය හා බැදේ .

41. " ධ ගෙන ති නක ධින " ..................................... තාලය අයත් සංගීත සම්ප්‍රදාය ..................................... වේ.

42. නව තාක්ෂණයේ දියුණුවත් සමඟම මුහුණේ ත්‍රිමාණ ගති ලක්ෂණය ඉස්මතු කිරිම සඳහා ..................................... හා ආලේපන ද්‍රව්‍ය යොදා ගනී.

43. ආදි කල්පිත ජන සමාජයන්හි නර්තනය සඳහා අනුකරණය හා සමාරෝපණය පිළිබඳ දක්වා ඇති .....................................හා ..................................... පඬිවරුන් දෙකකි.

44. කථක් නර්තන ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න.

i. ......................................................... ii. .........................................................

45. මහ තේ වතුර ..................................... ශාන්තිකර්මයේ චාරිත්‍ර විධියක් ලෙස ගැනෙන අතර මී බන්ධනය නාටයමය පෙළපාළියේ මීමා නිරූපණය කරන පුද්ගලයා ........................................................ නමින් හැඳින්වේ.

46. බලියේ ස්වභාවය වර්ණනා කෙරෙන ..................................... කවි ලෙසද, යම, කාල, මුර්තු, පිළිබඳ විස්තර කරන කවි..................................... ලෙසද හැඳින්වේ.

47. විහාර, ග්‍රාම, දේව පූජා වල චක්කියාවරු විසින් ඉදිරිපත් කල ..................................... ගැමි නාටක සහ ..................................... රජු විසින් නිර්මාණය කල රාමආට්ටම් කථකලි නර්තන සඳහා බලපාන ලදී.

48. " දෝං ගංද ගත්ත ගත්ත - ගුදං ගුදං ගත්ත ගතම් " ..................................... ශාන්තිකර්මයේ එන .....................................නාට්‍යෝචිත අවස්ථා සඳහා යොදා ගන්නා බෙර පදයි.

49. " දොංත ගතම් දොංත ගති ගතම් " ..................................... කෝළම් නාටකයේ ..................................... චරිතය නිරූපණය කිරිම සඳහා යොදා ගනී.

50. භරත නාට්‍යම්හි මූලික අංග හරය ..................................... හා එහි කළඑලි මංගල..................................... නමින් හැඳින්වේ.

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2019

## නර්තනය- II - කොටස

පාසලේ නම : ……………………………………………………………

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ……………………………………

……………………………………

කාලය : පැය 3 යි.

**පළමු කොටසින් ප්‍රශ්න 2ක්ද, ii , iii , iv කොටස් වලින් ප්‍රශ්න එක බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

### I - කොටස

01. i. " දොංතකු දොංජිං ගත්තත් ජිංතත් ජිං ජිං කඩතක" අදාල තාල රූපයට ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

ii. "ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට හිරුදෙවි අධිපති වන්නේ"රංසිරි වසගෙන සුරත දරාගෙන තුරගෙකු පිට වැඩ ඉන්නේ "මෙම කොටස මාත්‍රා 4 + 4 තාල රූපයට ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

iii. ශුද්ධ මාත්‍රයේ එන "රුද ගත ගත ගදිත ගතම් " යන ඉරට්ටියට අදාල තිතට ප්‍රස්ථාර කරන්න. (ලකුණු 08)

02. " නර්තන ගායන වාදන මෙන්ම චරිත නිරූපන අවස්ථාද දේශීය ශාන්තිකර්ම වල අන්තර් ගතය."

i. වලියකුම පැවැත්වීමේ අරමුණු හා පරමාර්ථ ලියා දක්වන්න. (ලකුණු 06)

ii. කිරි මඩුව ශාන්තිකර්මය හා බැඳි නර්තන හා ගායනා අවස්ථා 02 බැගින් විස්තර කරන්න. (ලකුණු 06)

iii. කිරි මඩු ශාන්තිකර්මය හා බැඳි සමාජ සාරධර්ම හා සමාජ සහජීවනය පිළිබඳ විස්තර කරන්න.(ලකුණු 08)

03. දේශිය ශාන්තිකර්මයන් ආගමික හා සමාජීය සාරධර්ම ඔස්සේ ගොඩනැගී ඇත.

i. වලියකුම ශාන්තිකර්ම හා බැඳි ආගමික පසුබිම පිළිබඳ විස්තර කරන්න (ලකුණු 06)

ii. රටයකුම ශාන්තිකර්මයේ හා පහන්මඩුව ශාන්තිකර්මයේ එන ගායන හා නාට්‍යමය අවස්ථා ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න. (ලකුණු 06)

iii. කිරිමඩු ශාන්තිකර්මයේ හා බලි ශාන්තිකර්මවල එන රංග සැරසිලි හා රංග භාණ්ඩ එහි කලාත්මක භාවය තීව්‍ර කිරීම සඳහා භාවිතා කරනා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

### II කොටස

04. දේශිය නර්තනය විකාශනයේ දී එක් එක් යුග වලට අයත් විවිධ වූ සාධක සොයාගත හැක.

i. ගම්පල යුගයේ නර්තනය කලාව පැවති බවට සාධක ඇසුරෙන් විස්තරයක් කරන්න. (ලකුණු 06)

ii. නර්තන කලාවට හින්දු ආභාෂය ලැබුණු ආකාරය යුග දෙකක් ඇසුරින් සනාථ කරන් (ලකුණු 06)

iii. වන්නම් නිර්මාණයේදී විවිධ සංස්කෘතික ලක්ෂණ බලපෑ ආකාරය විස්තර කරන්න (ලකුණු 08)

Education NCP - www.edncp.lk

05. " දේශිය නර්තන කලාව හා වාදන කලාව මනා වූ සුසංයෝගයෙන් ගොඩනැගී ඇති කලා අංග වේ. "

i. වාද්‍ය භාණ්ඩ සැකසීමේ චාරිත්‍ර විධි පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06)

ii. සාම්ප්‍රදායික එක් වාද්‍යභාණ්ඩයක් සකස් කිරීමේ අනුපිළිවෙල ලියා දක්වන්න. (ලකුණු 06)

iii. දේශිය නර්තනය හා වාදනය බෞද්ධ ආගමික කටයුතු සඳහා යොද ගත් ආකාරය විමසන්න. (ලකුණු 08)

## III කොටස

06. නර්තන නිර්මාණ කරනයේදී ආනුෂාංගික කලාවන්ගෙන් ලැබෙන පිටිවහල අතිමහත්ය.

i. දේශිය නර්තන සම්ප්‍රදායන්හි භාව නිරූපණය සඳහා රස, භාව සංකල්පය බලපාන අයුරු පහත චරිත ඇසුරින් විමසන්න.

- ඊරි යකා
- ජස
- නොංචි

(ලකුණු 06)

ii. ශාන්තිකර්ම වල අන්තර්ගත චරිතාත්මක අංග විධික්‍රම 02ක් හඳුන්වා, නූතන අංගරචනය ක්‍රම 02ක් විස්තර කරන්න. (ලකුණු 06)

iii. රංග ආභරණ සකස් කිරීමේදී, සම්ප්‍රදායික රංග ආභරණ වල සුවිශේෂ ලක්ෂණ 02ක් විස්තර කර නිර්මාණාත්මක රංග ආභරණ කට්ටලයක් සකස්කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 08)

07. භරතීය නර්තන සම්ප්‍රදාය ආගමික පසුබිම මත විකාශනය වී ඇත.

i. භාරතීය නර්තන සම්ප්‍රදායන් 02 ක් තෝරා ගෙන එහි ආරම්භය හා විකාශනය සිදු වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. ඉහත පාඨය සම්ප්‍රදායන් දෙකක නර්තනාංග 02ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

iii. කර්ණාටක සංගීත සම්ප්‍රදාය මත ගොඩ නැගී ඇති නර්තන කලාවන්ගේ සංගීත පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

## IV කොටස

08. දේශිය මුද්‍රා නාට්‍ය කලාව නව ආරකට ගමන් කරමින් කලා කෘතීන් රැසක් බිහිවී ඇත.

i. " බැරිසිල් " හෝ " පටාචාරා " කලා කෘතියේ තේමාව හා වස්තු බීජය පිළිබඳ විමසන්න. (ලකුණු 06)

ii. ඔබ තෝරාගත් කලාකෘතියේ සංගීතය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06)

iii. එම කතා පුවත මගින් සමාජයට ලබාදෙන ආදර්ශයන් පිළිබඳ සාකච්චා කරන්න. (ලකුණු 08)

09. ප්‍රේක්ෂක අවධානය රූපවාහිනි වැඩසටහන් වෙත රඳවා තබා ගැනීමට නර්තනය බෙහෙවින් ඉහවල් වී ඇත.

i. අධ්‍යාපන රූපවාහිනී වැඩසටහන් ප්‍රේක්ෂක රසවින්දනය සඳහා නිර්මාණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. නර්තන කලාවේ දියුණුවට සංගිත කලාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06)

iii. දේශිය සංස්කෘතිය හා සාරධර්ම ආරක්ෂා කිරීම හා පවත්වා ගැනීම සඳහා රූපවාහිනී නර්තන අංග සකස් විය යුතු ආකාරය කෙබඳු විය යුතුද යන්න පැහැදිලි කරන්න. (ලකුණු08)

Education NCP - www.edncp.lk